# ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
# SRI LANKA INVENTORS COMMISSION
# இலங்கைப் புத்தாக்குநர் ஆணைக்குழு
## [Ministry of Science, Technology and Research]


මගේ අංකය / எனது இல: / My No. } SLIC/1-7/89(Internship for lawyers)

ඔබේ අංකය / உமது இல: / Your No. }

දිනය / திகதி: / Date } 2019.08.23

පීඨාධිපති
විවෘත විශ්වවිද්‍යාලය
තැ.පෙ. 21, නාවල
නුගේගොඩ 10250

මහත්මයාණෙනි/ මහත්මියනි,

<u>නීතිඥයින් සඳහා සීමාවාසික පුහුණුව</u>

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති රාජ්‍ය ආයතනයක් වන අතර වර්තමානයේ විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මේ වන විට කොමිසමේ පේටන්ට් බලපත්‍ර ඉල්ලුම්පත් සකස් කිරීමේ උපදේශන සේවාවක් ලබාදීමට වෙනමම අංශයක් ස්ථාපිත කර ඇති අතර ආයතනය සතුව පවතින සීමිත කාර්ය මණ්ඩලය හේතුකොට ගෙන ඉහත සේවාව අපේක්ෂිත පිරිදි නව නිපැයුම්කරුවන් සඳහා ලබාදීමට හැකියාවක් නොමැති වී ඇත. එම හේතුවෙන් නීති ක්ෂේත්‍රයේ නිපුණතාවක් ඇති අයගේ සේවාව දෛනික ගෙවීමේ පදනම මත ලබා ගැනීම පිළිබඳ මේ වන විට සලකා බලමින් සිටී.

එසේ තාවකාලික පදනම මත ලබා ගන්නා නීතිඥවරුන් සඳහා පේටන්ට් බලපත්‍ර ඉල්ලුම්පත් සකස් කිරීම සම්බන්ධයෙන් විශේෂ පුහුණුවක් ලබාදීමට ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව තාවකාලික පදනම මත සේවය ලබාදීමට ඉදිරිපත් වන නීතිවේදී උපාධිය හෝ පාඨමාලාවන් හදාරමින් සිටින ආයතනික පුහුණුවක් අවශ්‍ය අයහට ඉහත ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් බවට පත්වීමේ අවස්ථාව ද මෙමඟින් උදාවන බව සතුටින් ප්‍රකාශ කර සිටිමි.

මෙ සම්බන්ධයෙන් කඩිනම පිළිතුරක් අපේක්ෂා කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ස්තූතියි.

මෙයට - විශ්වාසී,

එන්. එන්. ඩබ්. දොලවත්ත
අධ්‍යක්ෂ(ප්‍ර. වි. නි)
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

එන්. එන්. ඩබ්. දොලවත්ත
අධ්‍යක්ෂ / ප්‍ර. වි. නි.
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
අංක 46 & 48, කොටා පාර
කොළඹ 08


46 & 48, කොටා පාර, කොළඹ 08
46 & 48, Cotta Road, Colombo 08

Telephone: 011-2676650
Fax: 011-2676646

Web: www.slic.gov.lk
Email: info@slic.gov.lk

Director:
Telephone: 011-2676650